කළාප අධ්‍යාපන කායීාලය -බළන්ගොඩ---කළාප අධ්‍යාපන කායීාලය -බළන්ගොඩ කළාප අධ්‍යාපන කායීාලය -බළන්ගොඩ---කළාප අධ්‍යාපන කායීාලය -බළන්ගොඩ කළාප අධ්‍යාපන කායීාලය -
බළන්ගොඩ---කළාප අධ්‍යාපන කායීාලය -බළන්ගොඩ කළාප අධ්‍යාපන කායීාලය -බළන්ගොඩ---කළාප අධ්‍යාපන කායීාලය -බළන්ගොඩ කළාප අධ්‍යාපන කායීාලය - කළාප අධ්‍යාපන කායීාලය -

# කලාප අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

| 11 ශ්‍රේණිය | පෙරහුරු පරීක්ෂණය 2022 1 පත්‍රය | පැය 1 යි |
|---|---|---|

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල , දී ඇති පිළිතුරු හතරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න

1. පහත ප්‍රකාශයන් අතුරින්, තොරතුරු සඳහා වඩාත් ගැලපෙන ප්‍රකාශය කුමක්ද?
   i. නිමල් ළඟ රුපියල් 100 ක් ඇත.
   ii. නිමල් කඩයකින් යම් භාණ්ඩයක් මිළදී ගනී
   iii. රුපියල් සීයේ ඉතිරි ලෙස රුපියල් 10 ක් ලබාදෙයි.
   iv. ඉතිරි රුපියල් 10 න් ටොපියක් මිළදී ගනියි.

2. අන්තර්ජාලය භාවිත කරන විට , බාහිරින් පැමිණෙන පුද්ගලයන්ගෙන් තම දත්ත හා තොරතුරු ආරක්ෂා කරගැනීම සඳහා අනුගමනය කළහැකි හොඳ පුරුද්දක් වන්නේ පහත සඳහන් කවරක්ද?
   i. ප්‍රතිවෛරස් මෘදුකාංගයක් ස්ථාපනය කිරීම.
   ii. මුර පදයක් භාවිත කිරීම.
   iii. තම දත්ත හා තොරතුරු වෙනත් බාහිර ස්ථානයක තැන්පත් කිරීම.
   iv. ගිණිපවුරක් (Firewall) ස්ථාපනය කිරීම.

3. වේගවත්ම දත්ත සම්ප්‍රේෂණය සඳහා කුමන සන්නිවේදන මාධ්‍යයක් භාවිත කරයිද?
   i. නොවැසුණු ඇඹරු කම්බි යුගල **(UTP)**
   ii. සමාක්ෂ කේබල**(Coaxial cables)**
   iii. ප්‍රකාශ තන්තු **(Fiber Optical)**
   **iv.** වැසුණු ඇඹරු කම්බි යුගල **(STP)**

4. පරිගණක තාක්ෂණය පරිණාමයේදී ,වර්තමාන පරම්පරාවේදී පහත සඳහන් කුමක් සිදුවී ද?
   (A) පරිගණක වල සැකසුම් හැකියාව (Processing Power) වැඩිවීම.
   (B) පරිගණක වල ධාරිතාවය (Storage capacity) වැඩිවීම.
   (C) ට්‍රාන්සිස්ටර් වෙනුවට රික්තක නළ භාවිත කිරීම.
   i. A හා B පමණී ii. B හා C පමණී iii. A හා C පමණී iv. ABC සියල්ල

5. පහත දැක්වෙන ප්‍රකාශ සළකන්න.
   (A) වාරක මතකය (Cache Memory) රෙජිස්තර මතකයට (Registry Memory) වඩා ප්‍රමාණයෙන් විශාලය.
   (B) සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) ඉක්මනින් ක්ෂය වන මතකයකි(Volatile Memory).
   (C) සංගත තැටියක(Compact Disk) දත්ත තැන්පත් කිරීමෙන් ,දත්ත ආරක්ෂා කරගත හැක.
   i. A හා B පමණී ii. B හා C පමණී iii. A හා C පමණී iv. ABC සියල්ල

6. **A** හා **B** නම් වූ පරිගණක දෙකෙහි මතක ධාරිතාව පිළිවෙළින් **2 TB හා 2X $2^{20}$ MB ක් වේ.** ඒවයේ මතක ධාරිතාව සම්බන්ධයෙන් නිවැරදි වගන්තිය වන්නේ කුමක්ද?
   i. **A** පරිගණකයට වඩා වැඩි මතක ධාරිතාවයක් **B** පරිගණකයට තිබේ.
   ii. **B** පරිගණකයට වඩා වැඩි මතක ධාරිතාවයක් **A** පරිගණකයට තිබේ.
   iii. පරිගණක දෙකෙහිම ධාරිතාවයන් සමානය .
   iv. පරිගණකයක ධාරිතාවය මෙම මිනුම් ක්‍රමයෙන් මැනිය නොහැක.

7. ක්‍රමලේඛයක් ක්‍රියාත්මක වීමේදී මධ්‍ය සැකසුම් ඒකකය ක්‍රියාත්මක වන ආකාරය අනුව පහත සඳහන් කවරක් නිවැරදි වේද?
   i. උපදෙස් ප්‍රධාන මතකයෙන් රැගෙන එනු ලබන අතර දත්ත ද්විතීයික මතකයෙන් ගෙන එනු ලබයි.
   ii. දත්ත ප්‍රධාන මතකයෙන් රැගෙන එනු ලබන අතර උපදෙස් ද්විතීයික මතකයෙන් ගෙන එනු ලබයි.
   iii. දත්ත හා උපදෙස් ප්‍රධාන මතකයෙන් (Main Memory) රැගෙන එනු ලබයි.
   iv. දත්ත හා උපදෙස් ද්විතීයික මතකයෙන් (Secondary Memory) රැගෙන එනු ලබයි.

8. මෙහෙයුම් පද්ධති මෘදුකාංගයක ප්‍රධාන කාර්යක් වන්නේ.
   i. පරිශීලකයා සතුටු කිරීම .
   ii. අන්තර්ජාලය ලබාදීම.
   iii. පරිගණක දෘඩාංග කළමණාකරණය
   iv. මෘදුකාංග වල තත්වය ආරක්ෂා කරදීම

9. විවිධ මෙහෙයුම් පද්ධති භාවිත කරන ගොනු ආකාරයක් (File format) නොවන්නේ මින් කුමක්ද?
   i. FAT 32 ii. Ext4 iii. BIT 16 iv. NTFS

10. පහත ක්‍රියාවලි අතුරෙන් මෙහෙයුම් පද්ධතියේහි (Operating System) මතක කළමණාකරණයට (Memory Management) අදාල නොවන ක්‍රියාවලිය කුමක් ද?
   i. දෘඪ තැටියට ප්‍රවේශ වී ඊළඟ කාර්යය කුමක්දැයි සොයා බලයි.
   ii. ප්‍රධාන මතකයේ ඇති මතක ප්‍රමාණය පිළිබඳ සොයාබලයි.
   iii. කාර්යයක් නිමවීමෙන් පසු මතකය මුදා හරියි.
   iv. ද්විතීයික මතකය, පරිගණකයේ කාර්යන් සඳහා ප්‍රමාණවත් දැයි සොයාබලයි.

11. පහත සඳහන් සංඛ්‍යා සලකන්න.
   (A) 10101 (B) 24573 (C) 67A15
   අෂ්ටකමය සංඛ්‍යා පද්ධතියකට අයත් වන්නේ මින් කවරක්ද ?
   i. A පමණී ii. B පමණී iii. C පමණී iv. A හා B පමණී

12. පහත අගයන් අතුරින් විශාලතම අගය කුමක්ද?
   i. $125_{10}$ ii. $11010111_2$ iii. $321_8$ iv. $AB_{16}$

13. Unicode භාවිත කළ විට නිරූපණය කළ හැකි අනුලක්ෂණ සංඛ්‍යාව ආසන්න වශයෙන් සමාන වනුයේ.
   i. $2X2^8$ ii. $2X\ 8^2$ iii. $2X2^{15}$ iv. $8^2$

14. උදෑසන ආහාර වේලක් සඳහා බත් (A) සහ සම්බෝල (B) ලබාදෙනු ලබයි. ඊට අමතරව අල හොදි (C) හෝ පරිප්පු (D) ලබාගත හැකිය. මෙම සංසිද්ධිය නිරූපණය කරන බූලීය ප්‍රකාශනය කුමක් ද?
   i. A . B AND (C + D) ii. A . B OR (C . D) iii. A . B OR (C + D) iv. A + B AND (C .D)




15. ඉහත තාර්කික පරිපථයේ Y හි ප්‍රතිදානය කුමක් විය හැකි ද?
   i. 0 ii. 1 iii. X iv. $\bar{X}$

16. පහත දැක්වෙන තාර්කික ද්වාරයට (Logic Gate) තුල්‍ය සත්‍යතා වගුව(Truth Table) වන්නේ මින් කුමක් ද?




i

| A | B | X |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

ii

| A | B | X |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |

iii

| A | B | X |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 0 |

iv

| A | B | X |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

17. පැතුරුම් පතක කෝෂයකට = ( 5 – 3 ) ^ 3 * (6 + 4 ) / 5 යන සූත්‍රය ඇතුල් කළවිට කුමක් දිස්වේ ද?
   i. 18 ii. 19 iii. 16 iv. 10

පහත දී ඇති පැතුරුම්පත ඇසුරින් 18 හා 19 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| 1 | A | B | A * B | (A * B) ^ 2 | (A * B) + B | |
| 2 | 7 | 10 | 70 | 4900 | 80 | |
| 3 | 9 | | 90 | 8100 | 100 | |
| 4 | 4 | | 40 | 1600 | 50 | |
| 5 | 8 | | 80 | 6400 | 90 | |
| 6 | 6 | | 60 | 3600 | 70 | |

18. C2 කෝෂයේ ඇති ආකාරයට එම සමීකරණය **C2** සිට **C6** දක්වා පිටපත් කරන ලදී. එවිට **C3** කෝෂයේ දැක්වෙන සමීකරණය වන්නේ.
   i. = A3 * B3 ii. = A3 * $B2 iii. = A3 * B$2 iv. = $A3 * $B$3

19. ඉහත පැතුරුම් පතේහි **E2** කෝෂය තුල ඇති සමීකරණය **E6** දක්වා පිටපත් කරන ලදී. **E2** කෝෂයේ අගයන් ලබාගත **නොහැකි** සමීකරණය / සූත්‍රය කුමක් ද?
   i. = (A2 *B$2)+B$2 ii. = C2 + B$2 iii. = (C2 - B$2) + 20 iv. = (A2 * B2) + 10

20. ප්‍රාථමික යතුර සම්බන්ධයෙන් වූ පහත ප්‍රකාශ සළකා බලන්න.
    (A) වගුවක රෙකෝඩ් අනන්‍ය ව හඳුනා ගත හැකි තීරුවක් හෝ තීරු සංයෝජනයක්.
    (B) ප්‍රාථමික යතුර තීරුවේ අනිවාර්යයෙන්ම දත්ත පැවතිය යුතුය.
    (C) ප්‍රාථමික යතුර තීරුවේ දත්ත අනුපිටපත් වීමක් සිදු නොවේ.

    ඉහත ප්‍රකාශ වලින් **සත්‍ය** කුමක් ද?

    i. A හා B පමණී   ii. B හා C පමණී   iii. A හා C පමණී   iv. ABC සියල්ල

ප්‍රශ්න අංක 21 හා 22 සඳහා පිළිතුරු සැපයීමට පහත වගු ඇසුරු කරගන්න.

| ItemCode | Item Name | Unit Price |
|---|---|---|
| Item001 | Bag | Rs.1500 |
| Item002 | Shoe | Rs.3000 |
| Item003 | Hat | Rs.600 |
| Item004 | Slipper | Rs.800 |
| Item005 | Purse | Rs.500 |

**Item වගුව**

| Sup_ID | Sup_Name | Contact_NO |
|---|---|---|
| Sup001 | Amal | 0712589584 |
| Sup002 | Suresh | 0757730938 |
| Sup003 | Gamini | 0785425876 |
| Sup004 | Arjun | 0742192308 |
| Sup005 | Ricash | 0769382226 |

**Supplier වගුව**

**Sales වගුව** →

| Date | ItemCode | Supplier_Code | Quantity |
|---|---|---|---|
| 9/11/2022 | Item002 | Sup001 | 2 |
| 9/11/2022 | Item004 | Sup002 | 3 |
| 9/12/2022 | Item003 | Sup001 | 5 |
| 9/12/2022 | Item001 | Sup003 | 4 |
| 9/12/2022 | Item003 | Sup001 | 5 |
| 9/12/2022 | Item002 | Sup004 | 5 |
| 9/13/2022 | Item002 | Sup002 | 6 |
| 9/13/2022 | Item004 | Sup005 | 4 |

21. ගාමිණී විසින් අලෙවිකර ඇති ආයිතමයේ නම කුමක් ද?

    i. Bag   ii. Shoe   iii. Hat   iv. Purse

22. දත්ත අනුපිටපත් වීමක් සිදුව ඇත්නම් , එම වගුව / වගු කවරක් ද?

    i. Item වගුව   ii. Supplier වගුව   iii. Sales වගුව   iv. වගු සියල්ලම

23. වදන් සැකසුම් මෘදුකාංගවල භාවිත වන (Table) සම්බන්ධයෙන් පහත සඳහන් වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක්ද?
    (A) කෝෂ දෙකක් හෝ වැඩි ගණනක් සංයුක්ත (Merge) කළ හැකිය.
    (B) තීරුවක් හෝ පේළියක් මකා දැමීම සිදුකළ නොහැක.
    (C) කෝෂයක් පැළිය (Split) හැකිය

    i. A හා B පමණී   ii. B හා C පමණී   iii. A හා C පමණී   iv. ABC සියල්ල

24. ඉලෙක්ට්‍රොනික සමර්පන මෘදුකාංගයක(Electronic Presentation) ,සංදර්ශනය ආරම්භ කිරීමට (View) භාවිත කළහැකි යතුරු පුවරු කෙටිමං වන්නේ.

    i. Ctrl + N   ii. Ctrl + M   iii. F5   iv. Alt + V

25. පහත සඳහන් වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක්ද?
    (A) විධාන පේළි අතුරු මුහුණත (CLI) වර්තමානයේ ඉතා ජනප්‍රියම අතුරු මුහුණත වේ.
    (B) WIMP ලබාදෙන්නේ චිත්‍රක පරිශීලක අතුරු මුහුණතේදීය (GUI).
    (C) විධාන පේළි අතුරු මුහුණත (CLI) හා සසඳන විට, චිත්‍රක පරිශීලක අතුරු මුහුණත (GUI) වඩා භාවිත මිතුරු (User-Friendly) වේ.

    i. A හා B පමණී   ii. B හා C පමණී   iii. A හා C පමණී   iv. A B C සියල්ල

26. නව පද්ධතිය සාර්ථක බව හඳුනාගැනීමෙන් පසු පැරණි පද්ධතිය ඉවත් කිරීම සිදුකරනුයේ , පද්ධතිය පිහිටුවීමේ කුමන අවස්ථාවේදී ද?

    i. ඍජු පිහිටුවීමේදී .   iii. නියමුමය පිහිටුවීමේදී .
    ii. සමාන්තර පිහිටුවීමේදී .   iv. අදියරමය පිහිටුවීමේදී

27. පද්ධති සංවර්ධන ආකෘති අතරින් අවසන් අදියර සංවර්ධනය කර, අවසන් වනතුරු ලැබෙන ප්‍රතිඵලය කිව නොහැකි ආකෘති ක්‍රමය වන්නේ මින් කවරක්ද?
   i. පුනර්කරණ වෘද්ධි ආකෘතිය .
   ii. මූලාදර්ශ ආකෘතිය .
   iii. දියඇළි ආකෘතිය .
   iv. සර්පිල ආකෘතිය

28. වෙබ් පිටුවක් සකස් කිරීමේදී වැසෙන උසුලනයක් (Closing tag) භාවිත නොකරන උසුලනය තෝරන්න.
   i. <ol> ii. <td> iii. <a> iv. <hr>

29. විස්තරාත්මක ලැයිස්තුවක් (Definition list) සකස් කිරීමට අදාල වන උසුලන පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
   i. <ol>, </ol> ii. <td> , </td> iii. <dl> , </dl> iv. <hr> ,</hr>

30. IP ලිපිනයක් සොයාගැනීම සඳහා වෙබ් අතරික්සුව (Browser) මගින් HTTP ඉල්ලීම යැවීම සඳහා පහත සඳහන් කුමක් භාවිත කරයි ද?
   i. තැපල් සේවාදායකය (Mail Server)
   ii. DNS සේවාදායකය
   iii. වසම් සේවාදායකය (Domain Server)
   iv. වෙබ් සේවාදායකය (Web Server)

31. අංකිත ග්‍රාපිකයක (Digital Graphic) මූලිකාංගයක් නොවන්නේ පහත සඳහන් කවරක් ද?
   i. විභේදනය (Resolution)
   ii. ප්‍රමාණය වෙනස් කිරීම (Size)
   iii. නිරපේක්ෂ කිරීම (Absolute)
   iv. වර්ණය වෙනස් කිරීම (Colour)

32. ගතික වෙබ් අඩවියක් (Dynamic Website) සකස් කිරීමට නුසුදුසු වෙබ් අඩවි සංවර්ධන භාෂාව කුමක් ද?
   i. PHP ii. ASP.net iii. HTML iv. JSP

33. අන්තර්ජාලය භාවිත කරමින් ,පරිශීලකයින්ගේ බැංකු ගිණුම් ,විද්‍යුත් තැපැල් ගිණුම් වල තොරතුරු රැස් කර මුදල් හෝ වටිනා තොරතුරු සොරාගනු ලබන හානිකර මෘදුකාංගයක් වන්නේ.
   i. Computer Worms
   ii. Computer Adware
   iii. Computer Phishing
   iv. Computer Hijacker

34. පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න.
   (A) අනවසරයෙන් පුද්ගලයන්ගේ ඡායාරූප අන්තර්ජාලයට මුදාහැරීම.
   (B) පුද්ගලයන්ගේ කීර්තිනාමයට හානි වන ආකාරයේ ප්‍රවෘත්ති අන්තර්ජාලය හරහා ප්‍රචාරය කිරීම.
   (C) මුරපද සොරාගැනීම.
   ඉහත කාර්යයන් වලින් සයිබර් අපරාධ (Cyber Crime) ගණයට අයත් වන්නේ කුමක් ද?

   i. A හා B පමණී ii. B හා C පමණී iii. A හා C පමණී iv. ABC සියල්ල

35. මාර්ගගත සාප්පු සවාරි ( Online Shopping ) සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති සලකා බලන්න.
   (A) පාරිභෝගිකයාට සාප්පු යාමට ගත වන ගමන් කාලය, ඉතුරු කරගත හැකිය.
   (B) මිළ දී ගැනීමට පෙර පාරිභෝගිකයාට භාණ්ඩය භෞතිකව පරීක්ෂා කළ නොහැකිය.
   (C) පාරිභෝගිකයන්ට ලාභදායී භාණ්ඩ පහසුවෙන් සොයාගත හැක.
   මාර්ගගත සාප්පු සවාරි සම්බන්ධයෙන් නිවැරදි වගන්ති වන්නේ ඉහත කවරක් ද?

   i. A හා B ii. B හා C iii. A හා C iv. A,B,C සියල්ල

36. පහත ව්‍යාජ කේතය සලකන්න.

```
Begin
        Count = 1
        Repeat
          Count = Count + 1
         Until   Count > 5
         Display  Count
End
```

   ඉහත ව්‍යාජ කේතයට අනුව එහි ප්‍රතිදානය කුමක් ද?
   i. 1 ii. 4 iii. 5 iv. 6

37. විචල්‍යයක් (Variable) සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සළකා බලන්න.

(A) විචල්‍යයකට නමක් (Name) හෝ හඳුන්වාදීමක් (Identifier) ඇත.

(B) විචල්‍යයකට දත්ත ප්‍රවර්ගයක් ( Data Type ) ඇත .

(C) විචල්‍යයක අගය ( Value) නිතරම වෙනස්විය හැක.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමක් ද?

i. A හා B ii. B හා C iii. A හා C iv. A ,B , C සියල්ල

38. පහත සඳහන් ව්‍යාජ කේත කොටස සඳහා පරිශීලයකු විසින් 4 , 5, 7, 2, 8 යන සංඛ්‍යා එකකට පසු අනෙක ආදානය කළේ නම් , එහි ප්‍රතිදානය වන්නේ කුමක් ද?

```
Terminal  = 2
X = 0
REPEAT
        Display  " Enter Number "
        Get  Num
                IF  num  >  X   THEN
                   X = num
                ENDIF
UNTIL  num = Terminal
Display   X
```

i. 2 ii. 5 iii. 7 iv. 8

39. පහත ව්‍යාජ කේතය ක්‍රියාත්මක කළවිට **@** ලකුණ කී වාරයක් දිස්වේ ද?

```
BEGIN
     P = 0
     REPEAT
             Q  =  P   MOD  3
               IF  Q = 2  THEN
               DISPLAY   " @ "
               ENDIF
             P = P + 1
     UNTIL  P > 5
END
```

i. 1 ii. 2 iii. 3 iv. එක් වරක්වත් නැත.

40.




ඉහත ගැලීම් සටහනට අනුව මුද්‍රණය වන අවසාන අගය වන්නේ.

# කළාප අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

| 11 ශ්‍රේණිය | **පෙරහුරු පරීක්ෂණය 2022** 11 පත්‍රය | පැය 2 යි |
|---|---|---|

- පළමුවන ප්‍රශ්නය සමඟ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න

1.

i. පහත සඳහන් වගන්ති තුන සළකා බලන්න.

.......**A**.......... යනු වෙබ් අඩවියක් තුල පවතින විවිධ සම්පත් හඳුනාගැනීම සඳහා වූ අනන්‍ය නාමයකි.

........**B**......... යනු අන්තර්ජාලය තුල පවතින සෑම වෙබ් අඩවියකම අනන්‍යතාවය.

........**C**......... යනු අන්තර්ජාලය තුළ ඇති යන්ත්‍රයක් හඳුනාගත හැකි අනන්‍ය අංකයකි.

පහත නම් සඳහන් වචන තුන **A , B , C** සඳහා ගැලපෙන සේ සකස් කරන්න.

( IP ලිපිනය , විශ්ව සම්පත් නිශ්චායකය (URL) , වසම් නාමය (Domain Name))

ii. පහත දක්වා ඇති සත්‍යතා වගුවට ගැලපෙනසේ , පහත දී ඇති තර්කන ද්වාරය වෙනස් කර නැවත අඳින්න (අවශ්‍ය හැඩතලය සහිත කටු සටහනක් ආකාරයට ප්‍රමාණවත් වේ.)

| ආදානය | | ප්‍රතිදානය |
|---|---|---|
| **A** | **B** | **C** |
| **0** | **0** | **0** |
| **0** | **1** | **0** |
| **1** | **0** | **1** |
| **1** | **1** | **0** |




iii. පහත සඳහන් **P** වගුවේ පවතින මතකයන්ට ගැලපෙන පරිදි ,එහි ධාරිතාවයන් **Q** වගුවෙන් සකසන්න.

| | **P** වගුව | | **Q** වගුව |
|---|---|---|---|
| **A** | සසම්භාවී ප්‍රවේශ මතකය RAM | **i** | **500GB –10TB** |
| **B** | සංඛ්‍යාංක බහුවිධ තැටිය ( DVD ) | **ii** | **3MB - 32MB** |
| **C** | නිහිත මතකය. (Cache Memory) | **iii** | **1GB - 64GB** |
| **D** | දෘඪ තැටිය. (Hard Disk) | **iv** | **1KB - 2KB** |
| **E** | රෙජිස්තර මතකය ( Register Memory) | **v** | **4.5GB – 9GB** |
| | | **vi** | **650MB – 900MB** |

(උදා :- **A** → **iii** )

iv. පහත සඳහන් වන්නේ රතු ,කොළ ,හා නිල් වර්ණය සඳහාවූ ෂඩ් දශමය කේතයකි.මෙහි ඉලක්කම් දෙකෙන් දෙක පිළිවෙලින් ඉහත වර්ණ නියෝජනය කරයි. රතු ,කොළ ,හා නිල් වර්ණයන්හි දශමය අගයන් සොයන්න.

**#CA7FD8**

v. පහත සඳහන් **P** වගුවේ පවතින විස්තරයට ගැලපෙන අදහස **Q** වගුවෙන් තෝරන්න.

| | **P** වගුව | | **Q** වගුව |
|---|---|---|---|
| **A** | ඒක පරිශීලක මෙහෙයුම් පද්ධතියකි. | **i** | පංගු බෙදීම |
| **B** | මෙහෙයුම් පද්ධතියක ගොනු ආකාරයකි. | **ii** | ප්‍රතිභාගිකරණය |
| **C** | පරිගණකයේ තැන්පත් කරනු ලබන දේවල් වෙන් වෙන්ව තැන්පත් කිරීමට පහසුකම ලබාදෙයි. | **iii** | ආකෘතිකරණය |
| **D** | ගොනු ආකෘතියක් භාවිත කරමින් , දෘඪ තැටියක දත්ත තැන්පත් කිරීමට සුදුසු පරිසරයක් සකසා දෙයි. | **iv** | FAT 32 |
| **E** | ගොනුවක කොටස් තැටියේ විවිධ ස්ථාන වල තැන්පත් වීම අවම කරමින් කාර්යක්ෂමතාවය ඉහළ නංවයි | **v** | උපස්ථ පිටපත් |
| | | **vi** | MS DOS |

(උදා :- **A** → **vi** )

vi. පහත දැක්වෙනුයේ 11 ශ්‍රේණියේ ළමයෙකු ගණිත විෂයේ හි ලද ප්‍රස්තාරයක් ,නිර්මාණය කිරීම සඳහා පැතුරුම් පතක් භාවිත කළ අවස්ථාවකි.

(A) $Y = x^2 + 2x - 3$ සූත්‍රයට අදාල Y හි අගය, **C4** කෝෂයට ලබාගැනීම සඳහා කෝෂයේහි ඇතුළත් කළ යුතු සූත්‍රය කුමක්ද?(මෙම සූත්‍රය **D4: I4** පරාසයට පිටපත් කළ විට අවශ්‍ය අගයන් ලබා දිය යුතුය.)

(B) පැතුරුම්පත් මෘදුකාංගයක මෙම ප්‍රස්තාරය නිර්මාණය කිරීමට සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක්ද?




vii. පහත සඳහන් **P** වගුවේ පවතින අදහසට ගැලපෙන පරිදි **Q** වගුව සකසන්න.

| | **P** වගුව | | **Q** වගුව |
|---|---|---|---|
| **A** | චන්ද්‍රිකා තාක්ෂණයේදී භාවිත කරයි. | **i** | ප්‍රකාශ තන්තු |
| **B** | මීටර් 100 ක පමණ දුරකට දත්ත සම්ප්‍රේෂණය කරයි. | **ii** | බ්ලූටූත් |
| **C** | ආලෝකය පරවර්තනය වෙමින් දත්ත සම්ප්‍රේෂණය කරයි. | **iii** | සමක්ෂක කේබල |
| **D** | රූපවාහිනි ඇන්ටනා සඳහා භාවිත කරයි | **iv** | නොවැසුණු ඇඹරූ කම්බි යුගල |
| **E** | රූපවහිනි දුරස්ථ පාලක වල භාවිත කරයි. | **v** | ක්ෂුද්‍ර තරංග |
| | | **vi** | අධෝරක්ත කිරණ |

(උදා :- **A** ⟶ **v** )

viii. වදන් සැකසුම් මෘදුකාංගයක වගුවකට සිදුකල හැකි කාර්යයන් කිහිපයක් **A** ,**B, C, D, E** වලින් පෙන්වා ඇත. පහත උපකාරක භාවිත කර **A** ,**B, C, D, E** නම් කරන්න




(අධි සන්ධාන (Hyperlink) , දිශාන්තිය වෙනස්කිරීම(Text Direction) , කෝෂ පරාසය සංයුක්ත කිරීම(Merge Cells) , සංකේත ඇතුළත් කිරීම(Bullets) , කෝෂ පැළීම(Split Cells)

ix. පහත දක්වා ඇති **P** නම් වූ අරාව සලකා බලන්න. මෙම අරාව තුළ නිඛිල **(integer)** අගයන් **5** ක් අඩංගු වේ.

| **P[0]** | **P[1]** | **P[2]** | **P[3]** | **P[4]** |
|---|---|---|---|---|
| **52** | **42** | **65** | **74** | **58** |

ඉහත **P** අරාව මත පහත පෙන්වා ඇති ව්‍යාජ කේතය ක්‍රියාත්මක කළවිට ලැබෙන ප්‍රතිදානය ලියා දක්වන්න

```
BEGIN
     Value  = P [ 0]
     K  =  1
     REPEAT
            IF  P [ k ] > value THEN
              Value = P [ k ]
            ENDIF
            K = k + 1
     UNTIL   ( K > 4 )
   DISPLAY Value
END
```

X. පහත සඳහන් **P** වගුවේ වගන්ති වලට ගැලපෙන ලෙස **Q** වගුව සකසන්න.

| | **P වගුව** | | **Q වගුව** |
|---|---|---|---|
| **A** | සමාජ මාධ්‍ය ජාල ඔස්සේ පුද්ගලයන්ට හිරිහැර හෝ මානසික පීඩනයට ලක්කිරීම | **i** | අංකිත බෙදුම Digital Divide |
| **B** | අංකිත බෙදුම දුරලමින් මිනිසුන් අතර ඇති කරනු ලබන බැඳීම | **ii** | ගිණිපවුර (Firewalls) |
| **C** | පරිගණක විද්‍යාගාරය ඇති පරිගණක හා අනෙත් විදුලි උපාංග සඳහා සැපයෙන වෝල්ටීයතාවය පාලනය කිරීම. | **iii** | මුරපද Passwords |
| **D** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීමට ඇතිපහසුකම හා හැකියාව මත සමාජය බෙදීමට ලක්කිරීම. | **iv** | සයිබර් අපරාධ Cyber Crime |
| **E** | පරිගණක ජාලයක ඇති පරිගණක අනවසර පිවිසුම්කරුවන්ගෙන් ආරක්ෂා කරගැනීම. | **v** | සර්ජන ආරක්ෂක Surge Protector |
| | | **vi** | අංකිත සේතුව Digital Bridge |

(උදා :- **A** ⟶ **iv** )

2. නිමල් යනු එක්තරා තේ දළු එකතු කරන්නෙක් ,ඔහු තේ ගොවීන්ගෙන් ලබාගන්නා අමු තේ දළු සඳහා මාසිකව ගෙවීම් සිදු කරයි. මාසයක් අවසානයේ ලිපිකරුවෙකුගේ සහය ලබාගන්නා නිමල්, ලබාදුන් අමු තේ දළු වල මිල ගණනය කර බිල් පතක් මගින් මුදල් ලබා දීම සිදු කරයි.

නමුත් ලිපිකරුගේ ගණනය කිරීම් වල දෝෂ පවතින බව ඔහු හඳුනාගත් අතර විකල්පයක් ලෙස බිල්පත් සකස් කිරීමට පරිගණක පද්ධතියක් භාවිත කරන ලෙසට මිතුරෙක් උපදෙසක් ලබාදුනි.
එම උපදෙසට අනුව බිල්පත් ගණනය කිරීම සඳහා පරිගණක පද්ධතියක් සකස් කර දෙන ලෙසට නිමල් විසින් SOP නැමැති සමාගමකට භාරදුනි.

i. පද්ධතියක් සකස් කිරීම සඳහා භාවිත කරනු ලබන පියවර මොනවාද ?
ii. SOP සමාගම පළමු පියවර ලෙස සිදුකරන කාර්යන් දෙකක් සඳහන් කරන්න.
iii. පරිගණක පද්ධතිය සකස් කර විසඳුම් පරික්ෂා කිරීමට භාවිත කළ හැකි පරීක්ෂණ ක්‍රම දෙකක් සඳහන් කරන්න.
iv. මෙම පද්ධතිය සකස් කිරීම නිසා නිමල්ට සිදුවූ වාසියක් හා අවාසියක් සඳහන් කරන්න.
v. මෙම පද්ධතිය සඳහා පොරොන්දු වූ මුදලට වඩා අඩක් අඩුවෙන් නිමල්ගෙන් අයකිරීම සිදු කෙරිණි. නමුත් SOP ආයතන හිමිකරු පැවසුවේ , මෙම පද්ධතිය සකස් කිරීම නිසා ඔවුන් විශාල ලාභයක් ලැබූ බවයි. එසේ පැවසීමට හේතුව කුමක්ද?
vi. නිමල් පරිගණක පද්ධතිය භාවිත කිරීම නිසා තොරතුරු තාක්ෂණ අංශයේ තවත් ව්‍යාපාර දියුණු විය. එසේ දියුණු වූ ව්‍යාපාර අංශයක් සඳහන් කරන්න.
vii. කාලයක් ගතවීමෙන් පසුව නිමල්ට මෙම පද්ධතිය හැසිරවීම තම ජංගම දුරකථනය හරහා සිදුකිරීමට අවශ්‍ය විය. ඔහු මේ බව SOP සමාගමට දැන්වීමෙන් පසු , එම කාර්ය ජංගම දුරකථනය හරහා සිදුකළ හැකි සේ සකස් කරදුනි. මෙම කාර්ය පද්ධති ජීවන චක්‍රයේ කුමන අදියරේ කාර්යයක්ද
viii. මෙම පද්ධතියේ මුද්‍රිත පිටපතක් ලබාගැනීම සඳහා වඩාත් සුදුසු මුද්‍රණ යන්ත්‍රය කුමක්ද?

3. පරිගණක උසස් අධ්‍යාපන ආයතනයක පැවැත්වෙන පාඨමාලා සඳහා ළමුන් ඇතුළත් කරගැනීමට සැකසූ දත්ත පාදිකයක් පහත දැක්වේ. එම දත්ත පාදිකය ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**Student Table**

| STNO | BATCH NO | NIC NO | FULL NAME | CONTACT NO |
|---|---|---|---|---|
| KL001 | 2015/01 | 955896025V | Gayani Nisansala | 071-2583697 |
| KL002 | 2015/02 | 952253256V | Shan Ganhewa | 077-7418529 |
| KL003 | 2016/01 | 962543254V | Sumeda Nissanka | 072-9513576 |
| KL004 | 2016/01 | 972352456V | Sooriya Bandara | 071-4569873 |
| KL005 | 2017/01 | 976543258V | Sumali Apsara | 075-9436824 |

**Course Table**

| COURSEID | COURSE | DURATION MONTH |
|---|---|---|
| IT/CE/C01 | SLCDL | 03 |
| IT/COM/D01 | DIPLOMA | 12 |
| IT/GR/D01 | GRAPHIC | 12 |
| IT/CAD/C01 | AUTO CAD | 04 |

**Batch table**

| BATCH NO | COURSEID | STARTING | COURSE FEE |
|---|---|---|---|
| 2015/01 | IT/CE/C01 | 01/02/2015 | RS.8000.00 |
| 2015/02 | IT/COM/D01 | 01/03/2015 | RS.38000.00 |
| 2016/01 | IT/GR/D01 | 01/02/2016 | RS.35000.00 |
| 2016/02 | IT/CAD/C01 | 01/03/2016 | RS.15000.00 |
| 2017/01 | IT/GR/D01 | 01/02/2017 | RS.40000.00 |

i. ඉහත වගු ඇසුරින් ප්‍රාථමික යතුරු දෙකක් ලියන්න. (වගුවේ නම සමඟ)

ii. ආගන්තුක යතුරු දෙකක් ලියන්න. (වගුවේ නම සමඟ)

iii. KL006 Nimal Anuhas නැමැති ශිෂ්‍යයා 2017/01 කන්ඩායමට අලුතෙන් එක්වුණි නම් යාවත්කාලීන කළයුතු වගු මොනවාද? (NIC NO 972518476 , CONTACT NO 0785496123, COURSEID IT/GR/D01 )

iv. 2018/01 කණ්ඩායම IT/JAVA/C01 නමින් JAVA PROGRAMING මාස 06 ක රුපියල් 50000/= ක අලුත් පාඨමාලාවක් 01/02/2018 දින හඳුන්වාදීමට පාලන අධිකාරිය තීරණය කළේ නම් යාවත්කාලීන කළයුතු වගු මොනවාද?

v. 2017/01 කණ්ඩායම සඳහා ඇතුළත්ව ඇති ළමුන් පිළිබඳ විමසුමක් (Query) සිදුකළේ නම් , එහි ප්‍රතිදානය (Output) ලියා දක්වන්න.

4. නිවාසන්තර පන්දුවාර 10 ක්‍රිකට් තරඟයේ, ලකුණු සටහන් කිරීම සඳහා පැතුරුම් පතක් භාවිතයෙන් ලකුණු සටහන් කිරීමට එක්තරා සිසුවෙකු ලකුණු පත්‍රිකාවක් නිර්මාණය කරන ලදී. එම පැතුරුම්පත් පත්‍රිකාවෙන් කොටසක් පහත දැක්වේ. මෙම පත්‍රිකාව හඳුනාගෙන පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F | G | H | I | J | K | L |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | පන්දු වාරය (Overs) | **1** | **2** | **3** | **4** | **5** | **6** | **7** | **8** | **9** | **10** | |
| 2 | අතිරේක ලකුණු | 2 | 0 | 1 | 4 | | | | | | | |
| 3 | පළමු පිතිකරු ලබාගත් ලකුණු | 2 | 6 | 1 | 0 | | | | | | | |
| 4 | දෙවන පිතිකරු ලබාගත් ලකුණු | 4 | 1 | 0 | 4 | | | | | | | |
| 5 | තෙවන පිතිකරු ලබාගත් ලකුණු | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| 14 | පන්දුවාරයේදී ලබාගත් ලකුණු | 8 | 7 | 2 | 8 | | | | | | | |
| 15 | පළමු පිතිකරුගේ මුළු ලකුණු | 2 | 8 | 9 | 9 | | | | | | | |
| 16 | දෙවන පිතිකරුගේ මුළු ලකුණු | 4 | 5 | 5 | 9 | | | | | | | |
| | | | | | | | | | | | | |
| 26 | කණ්ඩායමේ මුළු ලකුණු | 8 | 15 | 17 | 25 | | | | | | | |
| 27 | අතිරේක ලකුණු ලබාගත් පන්දුවාර | | | | | | | | | | | |
| 28 | වැඩිම ලකුණු ලබාගත් පන්දුවාරය | | | | | | | | | | | |
| 29 | පන්දුවාරයක සාමාන්‍ය ලකුණු | | | | | | | | | | | |

i. කණ්ඩායමේ මුළු ලකුණු සෙවීම සඳහා **B26** කෝෂයට (Cell) ඇතුළත් කලයුතු ශ්‍රිතය/ සූත්‍රය කුමක්ද?. මෙය **K26** දක්වා පිටපත් කළවිට අවසානයේ කණ්ඩායමේ මුළු ලකුණු ලැබිය යුතුය.

ii. **K26** කෝෂයේ දැක්වෙන ශ්‍රිතය/ සූත්‍රය කුමක්ද?.

iii. අතිරේක ලකුණු ලබාගත් පන්දුවාර ගණන **B27** කෝෂයට ලබගැනීමට සූත්‍රයක් ලියන්න.

iv. වැඩිම ලකුණු ලබාගත් පන්දුවාරය සෙවීම සඳහා සූත්‍රයක් **B28** කෝෂයට ලියන්න.

v. පන්දුවාරයකදී ලබාගත් සාමාන්‍ය ලකුණු **B29** කෝෂයට ඇතුළත් කළේ නම් **B29** හි දැක්වෙන සූත්‍රය කුමක්ද?. මෙය **K29** දක්වා පිටපත් කළවිට පන්දුවාරයක සාමාන්‍ය ලකුණු ලැබිය යුතුය.

5. පහත සඳහන් වගන්ති සත්‍ය හෝ අසත්‍ය ලෙස ප්‍රකාශ කරන්න.

(i) HTML භාෂාව ලිවීම සඳහා Text Editor හෝ HTML Editor මෘදුකාංගයක් භාවිත කරයි.

(ii) HTML උසුලන මගින් වෙබ් පිටුව සංදර්ශනය කළයුතු ආකාරය වෙබ් අතිරික්සුවට පෙන්වා දෙයි.

(iii) HTML උසුලන දැක්වීමේදී ඉංග්‍රීසි කැපිටල් සහ සිම්පල් භේදය බලපානු නොලබයි.

(iv) WWW.bluehost.com යනු වසම් නාම ලියාපදිංචි කලහැකිවෙබ් අඩවියකි.

(v) Filezilla යනු වෙබ් අඩවි භාගත කරගත හැකි මෘදුකාංගයකි.

```
<HTML>
<HEAD>
        <TITLE>අ:පො:ස:(ස:පෙළ) විභාගය 2022</TITLE>
</HEAD>
<BODY BGCOLOR="FFFFFF">
< (1) ><CENTER>අ:පො:ස:(සා:පෙළ) විභාගය 2022</CENTER><(1) >
<P><(2) > කොවිඩ් වසංගතය නිසා දරුවන්ගේ අධ්‍යාපනය සඳහා
වැය කළ යුතු කාලය  විශාල වශයෙන් අපතේ යන ලදී. මේ හේතුව
නිසා ළමුන්ට සිදුවූ හානිය ලෙස <(2) ><p>
<(3) >
 <li>ළමුන්ගේ ඉගෙනුම් කාලය අපතේ යාම </li>
 <li>විභාග කල් යාම </li>
 <li>ළමුන්ට පීඩනයක් ඇතිවීම </li>
 <li>ආර්ථික ගැටළු නිසා අධ්‍යාපනයට බාධා ඇතිවීම  </li>
    ආදිය දැක්විය හැක.
<CENTER>< (4)  ="Education.jpg" ALIGN="BOTTOM"> </CENTER>
<HR>
 <p> ළමුන්ට මඟහැරුණු අධ්‍යාපනය සඳහා අධ්‍යාපන
     අමාත්‍යාංශය මගින් ලබා දී ඇති පහසුකම් </p>
  < (5)  ="http://WWW.nie.lk">ජාතික අධ්‍යාපන
          ආයතනය</a><br/>
  < (5)  ="http://WWW.ethaksalawa.lk">අධ්‍යාපන
          අමාත්‍යාංශය</a><br/>
  < (5)  ="http://WWW.enanapiyasa.lk">සබරගමුව
          අධ්‍යාපනදෙපාර්තමේන්තුව</a><br/>
 </BODY>
</HTML>
```

අ:පො:ස:(ස:පෙළ) විභාගය 2022

කොවිඩ් වසංගතය නිසා දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැය කළ යුතු කාලය විශාල වශයෙන් අපතේ යන ලදී.මේ හේතුව නිසා ළමුන්ට සිදුවූ හානිය

1. ළමුන්ගේ ඉගෙනුම් කාලය අපතේ යාම
2. විභාග කල් යාම
3. ළමුන්ට පීඩනයක් ඇතිවීම
4. ආර්ථික ගැටළු නිසා අධ්‍යාපනයට බාධා ඇතිවීම

ආදිය දැක්විය හැක.



ළමුන්ට මඟහැරුණු අධ්‍යාපනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දී ඇති පහසුකම්

ජාතික අධ්‍යාපන ආයතනය
අධ්‍යාපන අමාත්‍යාංශය
සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(VI) ඉහත පෙන්වා දී ඇති **HTML** ප්‍රභවය හා එයට අදාළ වෙබ් පිටුවයි. **HTML** ප්‍රභවයේ සමහර උසුලන නොමැති ඒවා **(1)** සිට **(5)** දක්වා ලේබල් කර ඇත. එයට ගැලපෙන නිවැරදි උසුලන පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා ගන්න. ඔබ විසින් ලිවිය යුත්තේ එක් එක් ලේබල අංකය සහ ඒ හා ගැලපෙන , දී ඇති ලැයිස්තුවෙන් තෝරා ගත් **HTML** උසුලන පමණි.

**( ol type="(I)" , alt , h2 , a href, Font size=4 , ul type = “1” , IMG SRC , border , )**

6. පහත වගුවේ දී ඇති විස්තර සලකා බලන්න.

| විස්තර අංකය | විස්තරය |
|---|---|
| 1 | ශරීර ඉදිමුම සහිත දැවිල්ල. ඔක්කාරය,ආතතිය, DNA හානිය,පිළිකා වැළදීම, හෘදවාහිනී ආබාධ |
| 2 | නොකඩවා පැය 6ක් 7ක් අතර කාලයක් පරිගණකයේ ඇලී ගැලී සිටීම.ඇස් රතුවීම,කඳුළු ගැලීම, පෙනීම අඩුවීම |
| 3 | ප්‍රයෝජනවත් මෘදුකාංගයක් ලෙස පෙනීසිටිමින් පරිගණකයට හානි කිරීම. |
| 4 | පරිගණක පද්ධතියක සිදුවන හදිසි බිඳවැටීම් වලින් අත්‍යවශ්‍ය දත්ත හා තොරතුරු ආරක්ෂා කරගැනීම. |
| 5 | කූට උපක්‍රම උපයෝගි කර ගනිමින් පෞද්ගලික ගිණුම් වෙත පිවිස පෞද්ගලික තොරතුරු සොරාගැනීම. |

(1) පහත (A) සිට (E) දක්වා වූ ලේබල ඉහත වගුවේ විස්තර හා සම්බන්ධ වේ. අදාල විස්තරයට අනුව වගුවේ අංකයට ගැලපෙන සේ (A) සිට (E) දක්වා වූ අක්ෂරය හා ගලපන්න.

(A) සයිබර් අපරාධ,

(B) ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීම,

(C) අනුපිටපත් (Backups)

(D) ට්‍රෝජන් අශ්වයා

(E) පරිගණක දෘෂ්ටි සහලක්ෂණ

(2) (P) සිට (T) දක්වා ඇති ලේබල මගින් පෙන්වා ඇති වැකි කොටස් ඉහත වගුවේ දක්වා ඇති ගැටලු සඳහා විසඳුම් සපයයි. වගුවේ ඇති ගැටලු අංකයට ගැලපෙන විසඳුම (P) සිට (T) දක්වා වූ අක්ෂරය හා ගලපන්න.

(P) භාහිර දෘඪ තැටි, සංයුක්ත තැටි, මතක කාඩ්පත් භාවිත කිරීම.

(Q) 3R භාවිතය (Reduce , Reuse , Recycle)

(R) පරිගණකය භාවිත කරන අතරතුර විටින් විට දුර වස්තූන් කෙරේ ඇස නාභිගත කිරීම.

(S) සමාජ ජාල භාවිතයේදී ප්‍රවේසම් වීම.

(T) ප්‍රති වෛරස් මෘදුකාංගයක් භාවිත කිරීම.

7.

(අ) පහත දක්වා ඇති **P** නම් වූ අරාව (array) සලකා බලන්න. මෙම අරාව තුල නිඛිල (integer) අගයන් 10 ක් අඩංගු කර ඇත. මේ ඇසුරින් **A හා B** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| **P[0]** | **P[1]** | **P[2]** | **P[3]** | **P[4]** | **P[5]** | **P[6]** | **P[7]** | **P[8]** | **P[9]** |
|---|---|---|---|---|---|---|---|---|---|
| 75 | 45 | 98 | 32 | 78 | 28 | 69 | 82 | 19 | 57 |

**(A)** ඉහත **P** අරාව මත පහත පෙන්වා ඇති ව්‍යාජ කේතය ක්‍රියාත්මක කළවිට ලැබෙන ප්‍රතිදානය ලියා දක්වන්න.

```
BEGIN
    Value = P[0]
    K = 1
    WHILE ( K ≤ 5 )
           IF P [ k ] < Value THEN
            Value = P [k]
           ENDIF
           K = k + 1
   ENDWHILE
   DISPLAY Value
END
```

**(B)** ඉහත ව්‍යාජ කේතය **P** නම් වූ සම්පූර්ණ අරාව තුල ක්‍රියාත්මක නොවන බව හඳුනාගනී. ව්‍යාජ කේතය සම්පූර්ණ අරාව තුල ක්‍රියාත්මක වීමට, ව්‍යාජ කේතයේ සිදුකළ යුතු වෙනස්කම කුමක්ද ?

(ආ) එක්තරා රබර් කිරි කපන්නෙක් සඳහා තම දෛනික රාජකාරිය වෙනුවෙන් රබර් ගස් 100 ක කිරි කැපිය යුතු අතර, ඊට වැඩිය කිරි කපන එක් ගසක් වෙනුවෙන් රු: 25 ක අමතර දීමනාවක් ලබාදෙන්නේ යැයි උපකල්පනය කරන්න. දිනකට උපරිම රබර් කිරි කැපිය හැකි රබර් ගස් ප්‍රමාණය 150 කි. යම් හෙයකින් දිනකට රබර් ගස් 100 ක කිරි කැපීමට නොහැකි වුණහොත් ඔහුට හෝ ඇයට තම දෛනික වැටුප හිමිවේ.

ඉහත කරුණු සඳහා නිරූපිත ගැලීම් සටහනක් පහත දැක්වේ. එහි සංසිද්ධි හඳුනා ගැනීම සඳහා උපකාර වදන් පෙළක් පහත දැක්වේ.

I. මෙම ගැලීම් සටහනේ **A , B , C ,D ,E** හිස්තැන් සඳහා සුදුසු වගන්ති පහත පිළිතුරු කොටුවෙන් තෝරා ලියා දක්වන්න.

II. මෙම ගැලීම් සටහනට අදාල වැඩසටහන නිර්මාණය කිරීමට සුදුසු පුනර්කරණයක් නම් කරන්න.

## <u>උපකාරක වදන් පෙළ</u>

**P** = දෛනික රාජකාරියට හිමි රබර් ගස් ගණන.

**Q** = දෛනික වැටුප

**R** = අතිකාල සඳහා හිමි රබර් ගස් ගණන.

**S** = දවසේ ආදායම (දෛනික වැටුප + අතිකාල)

| පිළිතුරු | | | |
|---|---|---|---|
| | P ≥ 100 | R ≤ 150 | P = P +R |
| | S = Q +(R X25) | R ≤ 50 | P = P + 1 |
| | R = R + 1 | R = 50 - 1 | P ≤ 100 |



# පිළිතුරු පත්‍රය ICT –2022 පෙරහුරු පරීක්ෂණය -බළන්ගොඩ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | iii | 11 | iv | 21 | i | 31 | iii |
| 2 | iv | 12 | iii | 22 | iii | 32 | iii |
| 3 | iii | 13 | iii | 23 | iii | 33 | iii |
| 4 | i | 14 | i | 24 | iii | 34 | iv |
| 5 | iv | 15 | ii | 25 | ii | 35 | iv |
| 6 | iii | 16 | i | 26 | ii | 36 | iv |
| 7 | iii | 17 | iii | 27 | iii | 37 | iv |
| 8 | iii | 18 | iii | 28 | iv | 38 | iii |
| 9 | iii | 19 | iv | 29 | iii | 39 | ii |
| 10 | iii | 20 | iv | 30 | ii | 40 | iii |

1 i IP ලිපිනය → C , විශ්ව සම්පත් නිශ්චායකය (URL) → A , වසම් නාමය (Domain Name) → B

Ii B වලට NOT GATE එකක් දමන්න.

Iii B → v , C → ii , D → I , E → iv

Iv 202 , 127 . 216

v B → iv , C → i , D → iii , E → ii

vi = (c3 * c3) + (2 * c3) – 3 , XY (Scatter)

vii B → iv , C → i , D → iii , E → vi

viii A → කෝෂ පැලීම(Split Cells) ,B → සංකේත ඇතුළත් කිරීම(Bullets) , C → අධි සන්ධාන (Hyperlink)

D → දිශාන්තිය වෙනස්කිරීම(Text Direction) , E → කෝෂ පරාසය සංයුක්ත කිරීම(Merge Cells) ,

Ix 74

X B → vi , C → v , D → I , E → ii

2 I SDLC පියවරවල් හය , ii නිරීක්ෂණ ,සම්මුඛ සාකච්චා, වර්තා ලිපිගොනු නිරීක්ෂණ ආදිය

Iii ඒකක පරීක්ෂාව , සමස්ථ පරීක්ෂාව ,පද්ධති පරීක්ෂාව , ප්‍රතිග්‍රහණ පරීක්ෂාව ,

Iv වාසිය -- කාලය ඉතිරිවීම , ගණනය නිවැරදි වීම ආදීය.

අවාසිය -- එකවර විශාල පිරිවැයක් දරන්න සිදුවීම ආදිය.

V මෙම පද්ධතිය වෙනත් පුද්ගලයන්ට අලෙවිකිරීමේ හැකියාව ආදිය.

Vi පරිගණක දෘඩාංග අලෙවි අංශය .

Vii පද්ධතිය නඩත්තු කිරීමේ කාර්යක්.

Viii Dot Matrix Printer , මුද්‍රිත පිටපතකට අවශ්‍ය වෙනස් වන දත්ත පමණක් මුද්‍රණය කිරීමේ හැකියාව.

මීට අමතරව වෙනත් ගැලපෙන පිළිතුරු සළකා බලන්න.

3 I Student Table → STNO ,BATCH NO / Course Table → COURSEID

Ii Batch Table → BATCH NO / Batch Table → COURSEID

Iii Student Table

Iv Course Table , Batch Table

V

| | | | | |
|---|---|---|---|---|
| KL005 | 2017/01 | 976543258v | Sumali Apsara | 075-9436824 |
| KL006 | 2017/01 | 972518476v | Nimal Anuhas | 078-5496123 |

4 I = Sum ($B26 :B26) / = Sum ($B$26 :B26)

Ii = Sum ($B26 : K26) / = Sum ($B$26 : K26)

Iii = Count (B2 : K2) Iv = Max (B14 : K14) V = Average ($B14 :B14)

5 I හරි (√ ) ii හරි (√ ) iii හරි (√ ) iv හරි (√ ) v වැරදි ( X )

Vi (1) → h2 , (2) → Font size 4 , (3) → ol type ="(1)" , (4) → IMG SRC , (5) → a href

6 (I) 1 → (B) . 2 → (A) , 3 → (D) , 4 → (C) , 5 → ( E )

(2) 1 → (Q) , 2 → (R) , 3 → ( T) , 4 → (P) , 5 → (S)

7 (අ) (A) 28 (B) K ≤ 9 / K < 10

(ආ) (i) (A) → P ≤ 100 , (B) → P = P + 1 , (C) → R ≤ 50 , (D) → S = Q + (R X 25) , (E) → R = R + 1

(ii) While Do

මෙම පිළිතුරු පත්‍රයේ පිළිතුරු වලට අමතරව වෙනත් ගැලපෙන පිළිතුරු සළකා බලන්න.